යන්නේ. මේ වගේ සාකච්ඡා පවත්වන්නේ. මන්ත්‍රීවරුන්ට කිසිම යුතුකමක් නැහැ, කිසිම අයිතියක් නැහැ මේ අවස්ථාවේ පිල් මාරු කරන්න. මන්ත්‍රීවරයෙක්ට අයිතියක් තියෙනවා ප්‍රතිපත්තිමය වශයෙන්, මතවාදී වශයෙන් තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂයට විරුද්ධව අදහසක් ප්‍රකාශ කරලා, මතයක් ප්‍රකාශ කරලා, වෙනත් පක්ෂයකට ඇතුල්වෙන්න. ඒක ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්.

උදාහරණයක් වශයෙන් එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක. එක්සත් ජාතික පක්ෂයෙන් ඉඳලා විරුද්ධ පක්ෂයට යන්නේ ප්‍රතිපත්තිමය කාරණයක් උඩ. මොකක්ද ප්‍රතිපත්තිමය කාරණය. එක්සත් ජාතික පක්ෂයේ විදේශ ප්‍රතිපත්තියට විරුද්ධවීම. එහෙම මන්ත්‍රීවරයෙකුට අයිතියක් තියෙනවා පක්ෂ මාරුකරන්න. අද අපිට පේනවා අමු අමුවේ මන්ත්‍රීවරු පක්ෂ මාරුකරන්නේ වරදානවලට, වරප්‍රසාදවලට, ඇමතිධූරවලට සහ මුදල්වලට කියන එක පේනවා. මේ මන්ත්‍රීවරුන්ට කතා කරපු දේවල්. මෙච්චර මුදලක් දෙන්නම්, මෙන්න මේ ඇමති පදවිය දෙන්නම්. පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරියන්ට, මන්ත්‍රීවරුන්ට, ප්‍රබල ඇමතිධූර දෙන්න පොරොන්දු වෙනවා. පිල්මාරු කරන්න පුළුවන් තත්ත්වයක් අද ඇතිවෙලා තියෙනවා. එහෙම නම් මේ රටේ මැතිවරණ තියන්නේ කුමකටද? මේ රටේ මහජන මුදල් නාස්ති කරන්නේ කුමකටද? 225 දෙනාට පුළුවන් නේ පැති මාරු කරකර පාර්ලිමේන්තුවේ ඉන්න. මෙන්න මේ අශීලාචාර දේශපාලනය නැති කරන්න තමයි 2015 මේ යහපාලන ආණ්ඩුව බලයට පත් කෙරුවේ. මේ ජනාධිපතිවරයාව පත් කෙරුවේ. රජයේ වැරදි එමට තිබුණා. අපි විශාල වශයෙන් ආණ්ඩුවට විරුද්ධව කතා කෙරුවා. හොරු ඇල්ලුවේ නැහැ කියන චෝදනාව, සමහර වංචා පිළිබඳ චෝදනා, මේ ආණ්ඩුවට එල්ල වුනා. හැබැයි ඒ අගමැතිවරයා වංචා, දූෂණවලට සම්බන්ධ වෙලා හිටියනම් කොහොමද හිටපු ජනාධිපතිවරයට අගමැතිධූරය දෙන්නේ. එහෙම නම් වෙන කෙනෙක් පත් කරන්න තිබුණානේ ජනාධිපතිවරයාට. වංචා දූෂණවලට සම්බන්ධ මන්ත්‍රීවරයෙක්. කොහොමද එතුමට පුළුවන් වුනේ හිටපු ජනාධිපතිවරයා ඉතාම පිරිසිදු කෙනෙක් ලෙස පත් කරන්න. මෙන්න මේක තමයි දේශපාලන වශයෙන් තියෙන අශීලාචාරකම. මේ තත්ත්වය අපි ඉදිරියට ගෙනියනවද? අපේ දරු පරපුරට අපි පවරන්නේ මේ වගේ රටක් ද?. මේ වගේ නීතියක් නැති. දේශපාලන බලලෝභයට මේ රටේ ජනතාව පාවිච්චි කරන්න පුළුවන්, පාර්ලිමේන්තු බලය පාවිච්චි කරන්න පුළුවන්, මේ වගේ ඉතාම අශිෂ්ට, ම්ලේච්ඡ තත්ත්වයක් ද අපි බාර දෙන්නේ අපේ අනාගත පරම්පරාවට.

**මම දහස් ගාණකට උගන්වලා තියෙනවා. අවුරුදු 30ක් මම විශ්ව විද්‍යාලවල උගන්වලා තියෙනවා. අපි ළමයින්ට උගන්වන්නේ මේවා නෙමෙයි. අපි උගන්වන්නේ යුක්තිගරුක භාවය, නීතියේ පාලනය, නීතියේ ආධිපත්‍යය,** මේවා තමයි අපි ළමයින්ට උගන්වන්නේ. එතකොට ඒ ශිෂ්‍යයින්, ඒ දරුවන්, අපෙන් අහන ප්‍රශ්නවලට අපි දෙන උත්තරය කුමක්ද? අපි දැන් එක් යුගයක් නිමා කරලා තියෙන්නේ මේ රටේ. මේ රටට දේශපාලන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ආණ්ඩුවෙන් තොරතුරු දැනගැනීමේ පනත ගෙනාවා, විගණන පනත ගෙනාවා, 19 වෙනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පාර්ලිමේන්තුව පණගැන්වුවා. මේ ජනාධිපතිවරයා මේවා තමයි කිව්වේ. මේ ජනාධිපතිවරයා කිව්වා මම එක පාරයි ඉදිරිපත් වෙන්නේ කියලා. මගේ බලතල සේරම පාර්ලිමේන්තුවට දෙන්න කිව්වා. නාමික තත්ත්වයකට පත් කරන්න මාව කිව්වා. අවුරුදු 05 ක් වැඩියි  අවුරුදු 04 ක් කරන්න කිව්වා. එහෙම කියපු ජනාධිපතිවරයා අද මොකක්ද කියන්නේ. නැවත වතාවක් ජනාධිපතිධූරය දැරීමේ ආශාවෙන් එතුමා පෙළෙනවා. තමන් හොරා කියලා හංවඩුගහපු, තමන් මිනීමරුවා කියලා හංවඩුගහපු, හිටපු ජනාධිපතිවරයාගේ පිරිසක් තමයි අද ජනාධිපතිවරයට  ඕන වෙලා තියෙන්නේ නැවත ජනාධිපතිධූරයට පත්වීම සඳහා. මේ වගේ අශිෂ්ඨ දේශපාලනයකටද අපි මේ රට ගෙනියන්නේ කියන එක තමයි මම මතු කරන්නේ මේ රටේ ජනතාවගෙන්.

ඒ නිසා අපි මේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කරන සටනට මේ රටේ විද්වතුන් විදියට, වෘත්තිකයින් විදියට අපි අවතීර්ණවෙලා ඉන්නේ. අපිට ප්‍රශ්නයක් නැහැ කව්ද අගමැතිවෙන්නේ කියලා. කුමන ආණ්ඩුවද බලයට පත්වෙන්නේ කියන එක අපිට අදාලා නැහැ. අපිට අදාල වෙන්නේ මේ ආණ්ඩුව නීත්‍යානුකූල ද, මේ පත් කිරීම් නීත්‍යානුකූලද, මේ කරන ක්‍රියාකාරකම් ශීලාචාර ද, ශිෂ්ඨ සම්පන්න ද, කියන කාරණා තමයි අපි මතු කරන්නේ. මම මේ වෙලාවේ ඒකාබද්ධ විපක්ෂයටත්, හිටපු ජනාධිපති, පත් කළ අගමැති මහින්ද රාජපක්ෂටත් දොස් කියන්නේ නැහැ. මම ඍජු ලෙස මගේ ඇඟිල්ල දිගු කරන්නේ වර්තමාන ජනාධිපතිවරයාටයි. එතුමාගේ වචන තමයි මම මෙච්චර වෙලා පාවිච්චි කළේ. අපේ වචන නෙමෙයි. එතුමා තමයි මේ රට ශීලාචාර රටක් බවට පත් කරනවා කියලා පොරොන්දු දීලා අද එතුමාම ඒක අනික් පැත්ත හරවලා අශිලාචාර රටක් බවට පත් කරන්න උත්සාහ කරනවා. නීතියේ පාලනයක් නැති රටක් වෙලා දැන්.

අපි මීට කලින් කිව්වා මේ මන්ත්‍රීවරු මාරු වෙන එක ගැන. සමහර මන්ත්‍රීවරු ඉල්ලා සිටියා නීතියක් දාන්න කියලා. පක්ෂ මාරු කිරීම ගැන. හැබැයි ඒක ප්‍රජාතන්ත්‍රවාදය අනුව කරන්න බෑ. හැබැයි මන්ත්‍රීවරු ශීලාචාර වෙන්න  ඕන. තමන්ගේ ජනවරමට පිටු නොපා ඉන්න තීන්දු කරන්න අද එබඳු තත්ත්වයක් මේ රටේ නැහැ. ඒ නිසා අපි ඇඟිල්ල දික් කරන්නේ මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, මේ ශිෂ්ඨ සම්බන්න නොවන, මේ ක්‍රියාවලියට විරුද්ධව තමයි අපි මේ පෙළ ගැහිලා ඉන්නේ.

6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය
rasikalogy.blogspot.com

# රට කාගෙන කාගෙන කාගෙන යන්න අපට නැවතත් චාන්ස් එකක් දෙන්න!

ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කර අඩ සියවසකින් අඩක් පමණ ගෙවුණේ වුව ද, ස්ථිර පදිංචිය ශ්‍රී ලංකාවෙන් කිලෝමීටර් නම දහසක් පමණ දුරින් වුව ද, කෙදිනක හෝ මිය ගොස් අළු වෙන්නේ ද මේ ඕස්ට්‍රේලියාවේ ම වුව ද, ශ්‍රී ලංකාවේ සිදුවන දේශපාලන පෙරළි පිළිබඳ ප්‍රවෘත්ති සහ ඕපාදූපවලින් ගැලවෙන්නට අපට හැකියාවක් නැති බව සක්සුදක් සේ පැහැදිලි ය.

මේ කාලයේ ශ්‍රී ලංකාවේ පවතින බලය සඳහා වූ බලු පොරය නිසා ම දශක දෙකකටත් වඩා පැරණි අපූරු මතකයක් යළි සිහියට නැගුණි. මේ ඒ කතාව යි.
ඒ වර්ෂ 1994 දී පැවැත්වුණු මහ මැතිවරණ සමයයි. ඊට දාහත් වසරකට පෙර 1977 දී බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ රජය ඒ වන විට මහා ජන අප්‍රසාදයකට පත්ව තිබුණි. එයට අමතරව ඔවුන් ගේ එදා 1977 දී සිටි නායකත්වයෙන් ඉතිරිව සිටියේ ද කීප දෙනෙකි. රණසිංහ ප්‍රේමදාසගේ මරණයෙන් පසු ඩිංගිරි බණ්ඩා විජේතුංග ජනාධිපතිවරයා ලෙස ද, රනිල් වික්‍රමසිංහ රටේ අගමැති ලෙසද කටයුතු කරමින් සිටියහ. මහජන පක්ෂය, බහුජන නිදහස් පෙරමුණ ආදී වශයෙන් පක්ෂ හදමින් අයාලේ ගිය චන්ද්‍රිකා බණ්ඩාරනායක ද, නැවත ශ්‍රීලනිප මහගෙදරට පැමිණ, කොළඹ පළාත් සභා ඡන්දය දිනා, මහ ඇමති ලෙස කටයුතු කරමින් සිටියා ය. මේ මැතිවරණයේ දී, වාමාංශික පක්ෂ හා එකතුව පිහිටුවා ගත් පොදු පෙරමුණට නායකත්වය දුන්නේ ඇයයි.

තමන් ම භීෂණය අවුළුවා, එම භීෂණයේ ම ගොදුරක් වුණු ජනතා විමුක්ති පෙරමුණේ ඇටසැකිල්ල අළු ගසා දමමින්, යළි පණ ලබමින්, එදා තරග වැදුණේ ආරිය බුලේගොඩ ගේ නායකත්වයෙන් පැවති ප්‍රගතිශීලි පෙරමුණු නම් පක්ෂයෙනි.
අද තරම් නොවූව ද, රූපවාහිනී නාලිකාවල දේශපාලන විවාද පැවැත්වුණි. ඊට අමතරව, විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් අපේක්ෂකයෝ විනාඩි පහළොවේ කතා ද පැවැත්වූහ. ඒ දිනවල, සන්ධ්‍යා යාමයේ මගේ විනෝදාංශය වූයේ, රූපවාහිනිය ඉදිරියේ සෝපානාරූඪ අර්තාපල් ගෙඩියක් සේ ඉඳගෙන ඒ දේශපාලන කතා සහ විවාද නැරඹීමයි.

එදා සන්ධ්‍යාවේ ප්‍රගතිශීලි පෙරමුණ නොහොත් ජවිපෙ නියෝජනය කරමින් තම විනාඩි පාලහේ කතාව ඉදිරිපත් කළේ තරුණියකි. ඇය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඡන්ද අපේක්ෂිකාවක් ලෙස පැවසිණි.
"ආ, මේ අපේ ෆැකල්ටියේ ජූනියර් බැච් එකක හිටි චම්පා සෝමරත්න නේ" මගේ බිරිඳ ඒ වෙන්ඩ-මන්ත්‍රීවරියව පහසුවෙන්ම හඳුනා ගත්තා ය.

ලංකාවේ මෑත ඉතිහාසයේ පැවති තට්ටු මාරු දේශපාලනය ගැන මා මෙතෙක් අසා ඇති උපහාසාත්මක ම නිර්වචනය මා ඇසුවේ එදා චම්පා සෝමරත්න කළ ඒ කතාවෙනි.

"සහෝදරවරුනි, සහෝදරියනි, ඔබ සැම දන්නවා, පසුගිය වසර දාහතක කාලයක් තිස්සේ දූෂණයෙන් සහ භීෂණයෙන් රාජ්‍යය කරමින් එක්සත් ජාතික පක්ෂය මේ රට කාගෙන, කාගෙන, කාගෙන යමින් සිටින බව."

"ඒ අතර අද පොදු පෙරමුණ කියන කල්ලියත් ඇවිල්ලා මේ ඡන්දේ දී ඔබෙන් ඡන්දය ඉල්ලනවා. සහෝදරවරුනි, සහෝදරියනි, ඒ මොකටද දන්නවද ඔවුන් අද ඔබේ ඡන්දය ඉල්ලන්නේ?"

"ඒ මේ එක්සත් ජාතික පක්ෂය විසින් රට කාගෙන, කාගෙන, කාගෙන ගිහින් නතර කරන තැන ඉඳලා අපිටත් කාගෙන, කාගෙන, කාගෙන යන්න අවස්ථාවක් දෙන්න කියලායි අද ඔවුන් ඡන්දේ ඉල්ලන්නේ."
ඇගේ ඒ කතාවට මා එකඟ වුවද, රටේ බහුතරයක ගේ තිබුණේ වෙනත් අදහස් ය. අවසානයේ එජාපය නැවැත්වූ තැන සිට රට කරගෙන යාමට ශ්‍රීලනිපයට පැවරුණි. සිදුවූයේ කුමක් දැයි අපි හොඳින් දනිමු. රට කාගෙන, කාගෙන, කාගෙන යාමේ රිලේ තරගය නොකඩවා ඇදී ගියේ ය.

ඉන් පසුව, 2001 දී ද, 2005 දී ද, 2015 දී ද, ශ්‍රී ලංකාවේ දේශපාලන පුටු මාරු සිදුවුණ ද, නැවත නැවතත් සිදුවුණේ එදා චම්පා සෝමරත්න කියූ පරිදිම රට කාගෙන කාගෙන කාගෙන යෑම නොනැවතී සිදුවීම පමණි.

අද නැවතත් අප එළැඹී ඇත්තේ ද, ඒ ආකාරයේ ම සන්ධිස්ථානයකට බව පෙනේ. මෙවර ද බැටන් එක් අතකින් තවත් අතකට මාරුවීම ව්‍යවස්ථානුකූලව ස්ථිර වුවත්, එසේ නොවී මේ තාවකාලික තත්වය අහෝසි වී ගියත්, රට කාගෙන, කාගෙන, කාගෙන යන රිලේ එක නම් නොනවැතී ඉදිරියට යාමට නියමිත බවට කිසිදු සැකයක් නැත.